**2013 අංක 01 දරණ සමෘද්ධි පනතහි 33(9) වගන්තිය ප්‍රකාර සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩල අනුමැතිය යටතේ නිකුත් කරනු ලබන විධානය :- 2018 අංක 02**

**<u>අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු ගිණුම් හී තැන්පතු මුදල් නිදහස් කිරීමේ බලතල පැවරීම.</u>**

අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 8/2017 දරණ 2017.03.29 දිනැති චක්‍රලේඛ උපදෙස් හී ඡේද අංක 2 (V) පහත පරිදි සංශෝධනය කරමි.

02. සමෘද්ධි බැංකු වල පවත්වාගෙන යන අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු ගිණුම් හී මුදල් පමණක් රු.25,000/- දක්වා නිදහස් කිරීමේ බලය බැංකු කළමනාකරුට පවරන අතර, එහි දී අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු මුදල් නිදහස් කිරීම චක්‍රලේඛ උපදෙස් කාරණාවන්ට පමණක් සීමා විය යුතුය.

03. ගිණුම් හිමියාගේ ඉල්ලීම අනුව, අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු මුදල් ඉල්ලුම් කරන හේතුව සනාථ කරගත් පසු තැන්පතු මුදල් නිදහස් කළයුතුය. එහි දී අවශ්‍යතාවය අනුව පියවරෙන් පියවර අනුව ද මුදල් නිදහස් කළහැක. මුදල් නිදහස් කිරීම පිළිබඳව පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය බව දන්වමි.

04. 2018 වර්ෂයේ සිට අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු මුදල් නිදහස් කිරීම පිළිබඳ පහත තොරතුරු සහිත රෙජිස්තරයක් නඩත්තු කළයුතුය.

i. ගිණුම් හිමියාගේ නම
ii. ලිපිනය
iii. ගිණුම් අංකය
iv. මුදල් නිදහස් කිරීමේ කාරණය.
v. නිදහස් කරන මුදල (රු.)
vi. නිදහස් කරන දිනය.
vii. ගිණුම් ලිපිකරු අත්සන.
viii. බැංකු කළමනාකරුගේ අත්සන.
ix. වෙනත්.(පියවරෙන් පියවර මුදල් නිදහස් කිරීමේ දී සටහන් කළයුතුය.)
x. පාලක මණ්ඩල ආවරණ අනුමැතිය ලත් දිනය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | | | | | |
|---|---|---|---|---|---|
| Tel-<br>Fax -<br>E-mail- | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General<br>011-2871672/2872202<br>011-2889002<br>dg@samurdhi.gov.lk | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் (மனிதவளம்)<br>Director (Human Resource)<br>011-2873799<br>011-2873996<br>diradmin@samurdhi.gov.lk<br>**Hot Line :0112-889007** | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant<br>011-2869742<br>011-2869742<br>finance@samurdhi.gov.lk | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance)<br>011-2889003<br>011-2887469<br>**Hot Line:0112-885582** | කාර්යාලය<br>அலுவலகம்<br>Office<br>0112872202<br>**Hot Line: 011- 2887722**<br>**Desktop - Isuri** |

05. බැංකු කළමනාකරුට තැන්පතු මුදල් නිදහස් කිරීමට අවශ්‍ය බලය විමධ්‍යගත කරනු ලබන්නේ ගිණුම් හිමියන්ගේ ඉල්ලීම් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා බවත්, එමෙන්ම මහජන බැංකුව/ ලංකා බැංකුව යන බැංකු හී පවත්වාගෙන යන තැන්පතු මුදල් සහ සමෘද්ධි බැංකුවෙහි ඇති අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් හී රු.25,000/- ඉක්මවා තැන්පතු මුදල් නිදහස් කිරීමේ බලතල තවදුරටත් නොවෙනස්ව ප්‍රාදේශීය ලේකම් සතු වන බව දන්වමි.

06. චක්‍රලේඛ උපදෙස් හී අනෙකුත් කරුණු තවදුරටත් නොවෙනස් වන බව දන්වමි.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩලයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්,**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.**